## 238 ඔබෙ සිරුරෙන්

ඔබෙ සිරුරෙන් අප වඩවා
ඔබෙ සිරිලේ අපට පොවා
අප ජීවත් කළ කිතු සමිඳේ
පුදමු ඔබට ජීවිත අපගේ

දෙව් වදනින් අප සනසා
දෙව් සමිඳුන් වෙත හරහා
අප ජීවත් කළ කිතු සමිඳේ
පුදමු ඔබට ජීවිත අපගේ

පව් අඳුරෙන් මෙලොව මුදා
දහම් රසේ මිහිර බෙදා
අප ජීවත් කළ කිතු සමිඳේ
පුදමු ඔබට ජීවිත අපගේ